ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2008 / 2009

නීති ක්‍රම – LWU 1412

කාලය – පැය 03 යි

---

දිනය : 2009.03.26 | වේලාව: පෙ. ව. 9.30 - ප. ව. 12.30


---

පළමු හා දෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

## පළමුවන කොටස - රෝම නීතිය

1. පහත දී ඇති රූප සටහන සහ කරුණු සලකා බලා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න




සෙම්ප්‍රෝනියස් සිය එකම උරුමකරු බවට පත් කරමින් ජස්ටිනියන් විසින් අන්තිම කැමති පත්‍රයක් සකස් කරන ලදි . ක්ලෝඩියස් විසින් තමාට පිහි පහරක් එල්ල කරනලද, බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් තමා දරුණු ලෙස තුවාල ලද, බවත් දක්වමින් ජස්ටිනියන් සිය අන්තිම කැමති පත්‍රයේ උරුමයෙන් ක්ලෝඩියස්ව බැහැර කළේය . තවද, ජස්ටිනියන් සිය රෝමයේ පිහිටි නිවස සිය බිරිද වන ග්ලේවියාට පැවරිය. ජස්ටිනියන්ට අයත් දේපලින් 25% ක් පමණ නීරෝට ඉතිරි වූ නමුත් ජූලියස් පිළිබඳව අන්තිම කැමති පත්‍රයේ කිසිවක් සඳහන් නොවීය. වහලෙක් බාලවයස්කරුවෙක් සහ තවත් පස් දෙනෙක් අන්තිම කැමති පත්‍රයට සාක්ෂිකරුවෝ වූහ.

පසුව ජස්ටිනියන් තම අන්තිම කැමති පත්‍රයට කොඩිසිල් පත්‍රයක් මගින් කරන ලද සංශෝධනයන් මගින් ග්‍රෝෂස් සහ ඔහුගේ වහලකු වන බෲටස් අන්තිම පත්‍රයේ ආදේශක උරුමකරුවන් ලෙස පත් කරන ලදි. ක්ලෝඩියස් ඔහුට වයස අවුරුදු 25 වන විට මිය ගිය අතර ඊට වසරකට පසුව ජස්ටිනියන් මිය ගියේය.

i. ජස්ටිනියන්ගේ අන්තිම කැමති පත්‍රයේ වලංගුභාවය පිළිබඳව සාකච්ජා කරන්න. (ලකුණු 10)

ii. අන්තිම කැමති පත්‍රයේ වලංගුභාවය පිළිබඳව සාර්ථක ලෙස අභියෝග කිරීමට ජුලියස්ටහැකි වන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. අන්තිම කැමති පත්‍රය අසාර්ථක වුවහොත් දේපල පැවරීම (බෙදීයාම) සිදුවන්නේ කෙසේද, යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

2. පහත ප්‍රකාශ වලින් **ඕනෑම දෙකක්** පැහැදිලි කරන්න.
ඔබේ පිළිතුර පැහැදිලි කිරීම සඳහා උදාහරණ භාවිතා කරන්න.

i කීර්ති නාමයට හෝ දේපලකට සිදුවන හානි සඳහා රෝම නීතිය ප්‍රතිකර්ම ලබා දී තිබුණි

ii හිමිකරුවෙකුට සිය දේපල සම්බන්ධයෙන් නිදහසේ කටයුතු කිරීමට ඇති අයිතිය පරවශතා මගින් සීමා විය .

iii රෝම නීතියේ සහ නූතන නීතියේ නීති මූලාශ්‍ර බෙහෙවින් සමානය.

iv දේපලක හිමිකාරීත්වය පැවරීම පිළිබඳ, සරල ක්‍රමයක් ජුස් ජෙන්ටියුම් හි අන්තර්ගත විය.

3. රෝම පුරවැසියකු වූ ජුලියට් ලොතාරියෝ සමග විවාහ ගිවිසුමකට එළඹුනාය. ඇය සිය හොඳම මිතුරිය වූ ක්ලියෝපැට්‍රාගෙන් මනාලියන්ගේ අලංකාර සුදු පැහැති ගවුමක් සහ දියමන්ති මාලයක් ඉල්ලා ගත්තාය. ක්ලියෝපැට්‍රා මනාලියන්ගේ ඇඳුම් සාප්පුවක හිමිකාරියක් වුවත් ජුලියට්ගේ මනාල යෙහෙළිය වශයෙන් සිටි නිසා කිසිදු අය කිරීමකින් තොරව භාණ්ඩ ඇයට ලබා දුන්නාය. තවද ජුලියට් සිය සහෝදරිය වූ වීනස් ගෙන් සිය වේලය සකස් කර ගැනීම සඳහා අනර්ඝ ලේස් ප්‍රමාණයක් ඉල්ලා ගත්තාය. ඇගේ විවාහ දිනයේදී විවාහ තෑග්ගක් වශයෙන් ඇගේ පියා ඇයට රෝමයේ පිහිටි නිවසක් තෑගි දුන් අතර ඇගේ මව දියමන්ති අරුංගල් ජෝඩුවක් ඇයට තෑගි කළාය. ජුලියට් දියමන්ති අරුංගල් ජෝඩුව හා මාලයට අමතරව එම ආභරණ වලට ගැලපෙන, තමා ළඟ ආරක්ෂාවට ඔයනා (රෝමයෙන් පිටව සිටි) විසින් තබන ලද දියමන්ති අත පළඳනාවක්ද, තම මංගල ඇඳුම සමග පැළඳ ගත්තාය.

විවාහ පිළිගැනීමේ උත්සවයේදී ජුලියට් සිය ස්වාමි පුරුෂයා වූ ලොතාරියෝට රෝමයේ පිහිටි නිවස ප්‍රසිද්ධියේ තෑගි කළාය. රාත්‍රී ආහාරය ගන්නා අතරතුරදී රතු වයින් වීදුරුවක් ඇගේ අතින් මංගල ඇඳුම මත ඉහිරිනු අතර එමගින් ඇඳුමෙහි ස්ථිර පැල්ලමක් ඇති විය. නික්ම යාමේ ඇඳුම මාරු කරන අතරතුරදී දියමන්ති අරුංගල් ජෝඩුව ගැලවූ ජුලියට් ඒවා කාමරයේ මේසය මත තැබුවාය. ඒවා යමෙකු විසින් සොරකම් කර තිබුණි. මධු සමය ගත කරද්දී ඇය දියමන්ති මාලය හා අත පළඳනාව හෝටල් කාමරයේ සේප්පුවක දමා වසා තැබුවාය. කෙසේ වෙතත් සේප්පුව කඩා ආභරණ සොරකම් කොට තිබිණි

පුලියට් විසින් එළඹෙන ලද විවිධ ගනුදෙනු සහ ඒවායේ දී ඇතිවූ සිද්ධීන්හි අනුශාංගයන් කේන්ද්‍ර කර ගනිමින් ඉහත සිදුවීම් වල නෛතික ප්‍රතිඵලයන් සාකච්ඡා කරන්න.

4. 'රෝම පවුලේ ස්වීය නෛතික නොවන සාමාජිකයා, ඔහුගේ හෝ ඇයගේ ජීවිතයේ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි සීමා කිරීම් වලට යටත් විය.'

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

## දෙවන කොටස - නීති ක්‍රම

5. 'පුංචි සූඩානය' යනු බොහෝ කලකට පෙර සූඩානයෙන් පැමිණ පදිංචි වූවන්ගෙන් පැවත එන්නන් වාසය කරන හුදකලා ප්‍රදේශයක පිහිටි ගමකි. රට පුරාම විවාහයන් සමරනු ලබන්නේ පල්ලියේ හෝ පෝරුවේ චාරිත්‍රයන් පැවැත්වීමෙන් වුවද, 'පුංචි සූඩානයේ' ගම් වැසියන් ඊට වෙනස් වූ විවාහ චාරිත්‍ර අනුගමනය කරති. මනමාලයා මල් මාලයක් පළඳවා පිළිගන්නා අතර යුවළ වෙනුවෙන් යාඥා කරමින් ඉටි පන්දම් අතින් ගත් කාන්තාවන්ගේ පෙරහැරක් පසු පසින් ගමන් කරති. අනතුරුව යුවළ ඔවුන්ගේ දෙමාපිය ආශිර්වාදය ලබා ගැනීම සඳහා, උල්පතක් ඉදිරිපිට කුඩයක් යට අසුන් ගනිති. අනතුරුව ඔවුන් තම නිවස වෙත ළඟා වී බිත්තර කැඩීමේ හා කොසු මිටි පිළිස්සීමේ චාරිත්‍ර (අයහපත් ක්‍රියාකලාප / පුරුදු ඉවත් කිරීම සංකේතවත් කිරීමක් ලෙස) අනුගමනය කරති. අනතුරුව ස්වාමි පුරුෂයා නිවසට ඇතුළු වීමට අවසර ඉල්ලා, එයට ඇතුළු වූ පසු පිළිස්සූ කුකුලු මස් දෙදෙනා විසින් එහිදී අනුභව කරනු ලැබේ. අවසානයේ යුවළ වෙත මල්, කාසි, සහල් සහ රස කැවිලි ඉසිනු ලැබේ.

මෑතකදී, ගමට පැමිණි රජයේ නිලධාරිහු අතර පල්ලියේ හෝ පෝරුවේ චාරිත්‍රයන් අනුගමනය නොකිරීම හේතුවෙන් ගම් වාසීන්ගේ විවාහ, නීත්‍යානුකූල විවාහයන් නොවන බවට දැනුම්දීමක් කළහ. අසූපස් වියැති කාන්තාවක් වූ මාරි කියා සිටියේ ඇගේ විවාහය එම චාරිත්‍ර ඉටු කරමින් පැවැත්වූ බවත්, ඇය තරුණ අවධියේදී ඊට සමාන විවාහයන් පිළිබඳව ඇයගේ මතකයේ පවතින බවත්ය. අනූ වියැති පීටර් කියා සිටියේ ඔහුද මෙම චාරිත්‍රයන්ට අනුව විවාහ වූ බවත්, සූඩානයේ සිට පැමිණි ඔවුන්ගේ මුතුන් මිත්තන්ගෙන් මෙම චාරිත්‍රය පැවත එන බව සිය පියා තමාට කියා ඇති බවත්, එසේම අද පවා එම චාරිත්‍ර එහි පවතින බවත්ය. ගමේ වෙනත් වැඩිහිටියකු වූ සයිමන් කියා සිටින්නේ තමා පල්ලියේ චාරිත්‍ර අනුව විවාහය සිදු කළද, තම විවාහය ගමේ අනෙකුත් පුද්ගලයන් පිළි නොගනීවි යැයි තමාට හැඟුණු නිසා හා මෙම චාරිත්‍ර අනුගමනය නොකලහොත් තමන් නිසි පරිදි විවාහ නොවූ බවක් තමාට දැනෙන නිසා තමන්ද මෙම චාරිත්‍රානුකූල විවාහ උත්සවයක්ද පැවැත්වූ බවයි.

ප්‍රාදේශීය චාරිත්‍රයන්ට අනුකූලව සිය විවාහයන් වලංගු වන බවට ඔප්පු කර ගත හැකිද යන්න පිළිබඳව 'පුංචි සූඩානයේ' ගම් වැසියන් ඔබගෙන් උපදෙස් පතයි.

ඔවුන්ට උපදෙස් දෙන්න.

6. 'නඩුවක් විනිශ්චය කිරීමේදී අනුගමනය කළ යුතු කිසිදු මාර්ගෝපදේශනයක් විනිසුරුවකු සතු නොවේ. නඩුවක් විනිශ්චය කිරීමේදී, තම අභිමතය භාවිතා කිරීමේ සම්පූර්ණ නිදහස ඔහු සතුවේ.'

ඉහත ප්‍රකාශයේ වලංගුභාවය සාකච්ඡා කරන්න.

7. සමහර අවස්ථාවලදී බරපතල තුවාල සහ මරණයන් සිදු කරමින් මෑත කාලීනව පාසැල් මහා තරඟ පාසැල් ක්‍රීඩා උත්සව හා ඒ හා සමාන ක්‍රියාවන්හිදී ප්‍රචණ්ඩත්ව මට්ටම ඉහළ යාමක් නිරීක්ෂණය කර ඇත. තවද, මෙවන් සිද්ධීන් වලට මැදිහත් වූ බොහෝ සිසුන් එම ක්‍රියාවන් හි යෙදී සිටින අවස්ථාවන් වලදී මත් පැන් භාවිතා කර තිබූ බව පෙනී ගොස් ඇත. මේ නිසා නීතියක් සම්මත කරමින් පාර්ලිමේන්තුව දක්වා සිටින්නේ 'කිසිදු සුරා සැලකින්, වෙළඳ සැලකින්, සුපිරි වෙළඳ සැලකින් හෝ වෙනත් කිසිදු ස්ථානයකින් වයස අවුරුදු 18 න් පහළ කිසිවකුට බ්‍රැන්ඩි, අරක්කු, හෝ වෙනත් පානයක් විකිණීම පහත යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් වන බවයි.'

රටේ ප්‍රමුඛ පෙළේ විදුහල් දෙකක් අතර පැවැත්වූ 'ද බැටිල් ඔෆ් ද බුල්ස්' මහා තරඟය අතර තුරදී පැන්ඩා සහ සමාගම, තරඟය පැවැත්වෙන ක්‍රීඩාංගනය අසල කුඩාරමක් ඉදිකොට තරඟයට සහභාගී වන්නන් සඳහා බියර් අලෙවි කරන ලදි. ග්‍රීන් ඇන්ඩ් වයිට් සමාගම ක්‍රීඩාංගනය අසල වෑන් රථයක් නවතා කෘතිම බ්‍රැන්ඩි සහ කෘතිම දොඩම් රස කාරක යෙදූ අයිස් කෝපි අලෙවි කළහ. කසිප්පු අලෙවි කරන කණ්ඩායමක්ද ගස් අතර සඟවා තිබූ බැරල් වලින් කසිප්පු අලෙවි කිරීමට පටන් ගත්හ.

ප්‍රදේශයට කඩා වැදුනු පොලිසිය පැන්ඩා සහ සමාගම, ග්‍රීන් ඇන්ඩ් වයිට් සමාගම සහ කසිප්පු අලෙවිකරුවන් සොයා ගත්හ. ඉහත නීතිය යටතේ කවුරුන් සඳහා චෝදනා නැගිය හැකිදැයි යන්න සම්බන්ධයෙන් ඔවුන් ඔබගේ සහය පතයි. අදාළ ව්‍යවස්ථා අර්ථ නිරූපන මූලධර්ම භාවිතා කරමින් පොලිසියට උපදෙස් දෙන්න.

8. පහත ප්‍රකාශයන්ගෙන් **ඕනෑම දෙකක** වලංගුතාවය සාකච්ඡා කරන්න.

i. නීති අදාල වන්නේ නීතියක් පැනවූවාට පසුව සිදුවන සිදුවීම් සඳහා පමණී.

ii. ප්‍රතිඵලය කෙතරම් දැඩි වුවත්, අසාධාරණ වුවත්, නීතිය අනුගමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විනිසුරුවරයා බැඳී සිටියි.

iii. පූර්ව තීරණයක් නිෂ්ප්‍රභා කිරීම සහ වෙනස් කොට දැක්වීම අතර සැලකිය යුතු වෙනසක් නැත.

iv. නීතිවේදීන්ගේ ලේඛණයන්, මුස්ලිම් නීතියේ වැදගත් කොටසකි.

හිමිකම් ඇවිරිණි

************